# 60

මගේ හද සමිඳුන් මහිමය පසසයි
මගේ සිත දෙවිඳුන් වෙත උදම් අනයි
කුළුණු ගුණේ පා සිය දාසියටා
දෙවිඳාණන් මා අසිරි වැඩුවා //

දෙවිඳු ප්‍රසංශා වේ ////

පැරකුම් සමිඳුන් දැසි මා උදෙසා
ඉමහත් දේ කල සැටි සිහි කරලා
පරසිදු සමිඳුන් කී ඒ ලෙසටා
පුන්‍යවන්ත වීමට වර ලැබුනා //

එතුමන් දයාව බැතිමත් දනටා
කුලෙන් කුලට නැග ඒ විකුමන් පා
උඩගු දනන් පොලොවට විසිකෙරුවා
දීන දසුන් අහසට ඔසවාලා //

සාගිනි වූවන් යහගුණ කවලා
ධනවත් අය නිතැනින් හිස් කරලා
ආබ්‍රහාම් හට පැවසූ ලෙසිනා
ඊශ්‍රායෙලුන් හට කරුණා පෑවා //

පිත් පුත් සුදතුන් තෙරුවන් දෙවිඳුන්
හට සැම කල්හිම තුති ගොස වේවා
අනාදියේ වූ ලෙස නිති දිනයේ
එලෙසම වේවා එලෙසම වේවා //